**කුරුවිට ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.2 (අ) (ආ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.459,387 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හා ප්‍රතිපූර්ණය වූ වැටුප් ආදායම රු.665,698 ක් වැඩියෙන් වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමට පිටපත් කර තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු. 206,311 ක් අඩු බව හා වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.459,387 ක් වැඩියෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් හා ලැබිය යුතු දෑ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලද වරිපනම් බදු ආදායම රු. 2,880,851 ක් වුවද, එය රු.3,369,959 ක් ලෙස වරිපනම් බදු ගිණුමට පිටපත් කර තිබීමෙන් ලැබිය යුතු වරිපනම් ශේෂය රු. 489,108 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂය තුළ ගිණුම්ගත කර නොතිබූ ආදායම් ණයගැතියෝ සමාලෝචිත වර්ෂයේ දී ද්විත්ව ගිණුම් තැබීමක් සිදුකර තිබීමෙන් වර්ෂය අවසානයට ආදායම් ණයගැතියෝ සහ සමුච්චිත අරමුදලේ ශේෂය රු. 16,910,533 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල පළාත් සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු රු.37,402,090 ක් වූ ප්‍රාග්ධන ආදායම හා ප්‍රාග්ධන වියදම ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල සියළු ගනුදෙනු ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පළාත් සභාවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ගිණුම්ගත කර තිබියදී වර්ෂය සඳහා බිල්කිරීම් ලෙස රු. 57,724,871 ක් නැවත ගිණුම්ගත කිරීමෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර හා වර්ෂයේ ප්‍රාග්ධන ආදායම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර තැන්පතු සහ ඒවාට අදාල පොළිය ගිණුම් තැබීමේදී සිදුව තිබූ දෝෂ හේතුවෙන් සමුච්චිත අරමුදලේ ශේෂය රු. 45,727,680 ක් වැඩියෙන් දැක්වුනු අතර වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 3,674,834 කින් හා ජංගම වත්කම් රු.7,349,668 කින් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුලදී අත්පත් කර ගෙන තිබූ රු. 32,247,187 ක් වූ දේපල, පිරියත හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂය තුල මිලදීගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාල මෙහෙයුම් වියදම රු.213,234 කින්ද, ප්‍රාග්ධන වියදම රු. 681,079 කින්ද ජංගම වගකීම් රු. 894,313 කින්ද අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල වියදම් හා ගෙවිය යුතු දෑ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක කල කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතුව හා ගෙවිය යුතුව තිබුණු එකතුව රු.1,985,463 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැතියෝ හා ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉකුත් වර්ෂයට අදාල ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 136,379,964 ක වෙනසක් නිරීක්ෂණය විය. | ආරම්භක ශේෂ වෙනස් වීමක් පවතින බැවින් එය නිවැරදි කිරීම සඳහා උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.8,931,176 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ගිණුම්වල ශේෂ දීර්ඝ කාලයක සිට පැවත එන අතර විස්තර සොයා ගැනීමට කිසිදු ලේඛනයක් නොමැති බැවින් දෙපාර්තමේන්තු කළමනාකරණ හා විගණන කමිටුවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට අපේක්ෂා කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, දීර්ඝ කාලයක් පුරා ඉදිරියට ගෙනඑන මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 94,509,380 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,751,962 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 12,668,083 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැයිස්තු සකසා කණ්ඩායම් බෙදා හිඟ එකතු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වුවද, කොරෝනා වසංගත තත්ත්වයේ තෙවන රැල්ල හේතුවෙන් එම වැඩසටහන තාවකාලිකව අත් හිටුවා ඇති බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කාලීනව කටයුතු කළ යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 515,889 ක් වූ හිඟ අක්කර බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම් පිළිබඳ විස්තර සභිකවරුන්ගෙන් ලබා ගැනීමට අදාළ ආකෘතිපත්‍ර ලබා දුන් අතර, එමඟින් ලබා ගන්නා තොරතුරු පරිදි ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිත බව. | අක්කර බදු සමීක්ෂණයක් සිදුකර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## (ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 2,928,555 ක් වූ අතර, මුද්දර ගාස්තු රු. 9,704,283 ක් විය. 2020 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල මුද්දර ගාස්තු ආදායම් හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන ඇති උසාවි දඩ හා මුද්දර ගාස්තු පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලුම් කර ඇති නමුත් මේ වන තෙක් ලැබී නොමැති බව හා හඳුනා නොගත් මුද්දර ගාස්තු ආදායම් හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් කාලීනව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොහොරබාව කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ජලය ලබා ගැනීමට විකල්ප මාර්ග තිබියදී නළ ළිඳක් ඉදිකිරීමට භූ විද්‍යාත්මක සමීක්ෂණයක් සිදුකිරීම සඳහා රු. 45,900 ක් වැය කර තිබුණි. පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් පසු ඒ සඳහා සභා අනුමැතිය නොලැබීම හේතුවෙන් වැය කරන ලද රු. 45,900 නිෂ්ඵල වියදමක් වී තිබුණි. | පරීක්ෂණ වාර්තාව අනුව මෙම ස්ථානයේ නළ ළිඳක් ඉදිකිරීම අසාර්ථක බව පෙනී යන බැවින් හා මීටර් 60 ක් පමණ ගැඹුරට මෙම නළ ළිඳ ඉදිකිරීම සිදු කල යුතු බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය නොලැබීම නිසා නළ ළිඳ ඉදිකිරීමේ කාර්ය ක්‍රියාත්මක නොකරන ලද බව. | වියදම් දැරීමට පෙර අවශ්‍යතාව හා එය සපුරාගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ විධිමත්ව අධ්‍යයනය කිරීමට අවධානය යොමු කළ යුතුය. |